# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ගුවන් ප්‍රවාහන (සංශෝධන)

**2018 අංක 29 දරන ගුවන් ප්‍රවාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා විසින් 2023 මැයි මස 23 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 අප්‍රේල් මස 03 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[180 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 10.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ගුවන් ප්‍රවාහන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ දේශීය ගුවන් ප්‍රවාහනය සඳහා අදාළ වන වගකීමේ සීමාවන් අමාත්‍යවරයා හට නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වීමය. එමගින් ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය සඳහා අදාළ වන වගකීමේ සීමාවන් හි ඉහළ සීමාව දේශීය ගුවන් ප්‍රවාහනය සඳහා අදාළ නොවීම ය.

එල්.ඩී.—ඕ. 33/2022

**2018 අංක 29 දරන ගුවන් ප්‍රවාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක දරන ගුවන් ප්‍රවාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2018 අංක 29 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 2018 අංක 29 දරන ගුවන් ප්‍රවාහන පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> "(3) ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනයක් නොවන ගුවන් ප්‍රවාහනය සඳහා අදාළ විය හැකි වගකීමේ සීමාවන් අමාත්‍යවරයා විසින්, කලින් කලට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.